# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

වාණිජ මුද්‍රණ, ආරක්ෂිත මුද්‍රණ, ප්‍රකාශන සහ ලිපි ද්‍රව්‍ය නිෂ්පාදන හා අලෙවි කටයුතුවල නියැලී, මනා ලෙස ස්ථාපිත ලාභ උපදවන වාණිජ ආයතනයක් වන රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පහත සඳහන් ඇබෑර්තුව සඳහා ජයග්‍රාහී අතීත වාර්තා සහිත උද්යෝගී හා ප්‍රතිඵල දිශාභිමුඛ ශ්‍රී ලාංකිකයෙකු බඳවා ගැනීමට බලාපොරොත්තු වේ.

## කළමනාකරු (අලෙවිකරණ) තනතුර

**එලදායි වෘත්තියකි**

අලෙවි දෙපාර්තමේන්තුවේ සියලුම කළමනාකරණ කටයුතු හා අලෙවි කුට්ටවල කාර්යයන්හි සමස්ත අධීක්ෂණය පිළිබඳව කාර්යභාරව සිටීම. සංස්ථාවේ නිෂ්පාදනවල අලෙවිය ප්‍රවර්ධනය කිරීමට ඵලදායී හා කාර්යක්ෂම අලෙවිකරණ උපායමාර්ග ක්‍රියාවට නැංවීම.

**සුදුසුකම්**

**අධ්‍යාපනික : (බාහිර)**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මූලික උපාධියක් (අලෙවිකරණය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විශේෂයි) සහ පශ්චාත් උපාධියක් (මාස්ටර්ස්) හෝ පිළිගත් වෘත්තීය ආයතනයක වරලත් සාමාජිකත්වය සමග රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්ද.

**අභ්‍යන්තර**

අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ ප්‍රභේදයේ i වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අය මෙම තනතුර සඳහා සුදුස්සෝ වෙති.

**අනෙකුත් අවශ්‍යතාවයන් :**

- අලෙවි කිරීමේ හා සාකච්ඡා කිරීමේ මනා දැනුම
- ප්‍රබල නායකත්ව ගුණාංග
- විශිෂ්ට සංනිවේදන කුසලතා
- මනා සංවිධානාත්මක බව
- ප්‍රබල කාර්යය සාරධර්ම
- උසස් අන්තර් පුද්ගල නිපුණතා
- විස්තර සඳහා සියුම් අවධානය
- පරිගණක සාක්ෂරතාව
- ක්‍රියාශීලී ස්වභාවය
- අලෙවි ඉලක්ක/ අරමුණු සපුරා ගැනීමේ හැකියාවැති කණ්ඩායමක් සමග වැඩ කිරීමට හැකි ගැටලු නිරාකරණය කරන්නෙකු සහ ස්වයංගාමක පුද්ගලයෙකු වීම.
- ඕනෑම අවස්ථාවක දිවයින පුරා සංචාරය කළ හැකි විය යුතුය.
- කොළඹ සහ තදාසන්න ප්‍රදේශයන්හි පදිංචි අයදුම්කරුවන් විශේෂයෙන් සලකා බැලේ.

**වැටුප් පරිමාණය**

HM 1-1- රු. 80,295/= 15X2270 - 114,345/= (මාසිකව)

**වයස් සීමාව :**

වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**අනෙකුත් වරප්‍රසාද :**

- කාර්යාලීය නිල සංචිත ප්‍රවාහන පහසුකම් හෝ චක්‍රලේඛ අංක PED1/2015(ii) ට අනුකූලව තමාගේම වාහනයට දීමනාවක් සහ ඉන්ධන.
  - ❖ ප්‍රවාහන දීමනාව රු. 50,000/=
  - ❖ මාසික ඉන්ධන සීමාව - ලීටර් 115

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකිනි.

**සේවා කොන්දේසි**

ඉහත තනතුර ස්ථිර තනතුරක් වන අතර, වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ. අභ්‍යන්තරිකව තෝරාගත් පෙර තනතුරෙහි දැනටමත් ස්ථිර කර ඇති සේවකයින් එක් (01) වසරක වැඩ බලන කාලයකට යටත් වේ.

අදාළ තනතුර සඳහා වැටුපට අමතරව, පහත සඳහන් දීමනාවන්ටද හිමිකම් ලබයි.

- ❖ **රජයේ අනුමත දීමනා**
  - වෘත්තීය දීමනාව - 3,000/=
  - ජීවන අංක දීමනාව - 17,800/=
  - වෙනත් දීමනා - 5,000/=
  - දුරකථන දීමනාව - 3,750/=
  - පැමිණීමේ දිරිගැන්වීම
  - ආහාර දීමනාව

**වෙනත් ප්‍රතිලාභ**

- ❖ සේවකයා සහ පවුල ආවරණය වන වෛද්‍ය රක්ෂණ ක්‍රමය.
- ❖ වාර්ෂික ප්‍රසාද දීමනා
- ❖ සේ. අ. අ. සහ සේ. භා. අ. (EPF සහ ETF)
- ❖ ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ලබාදීම

**අයදුම් කළයුතු අන්දම**

සම්පූර්ණ ජීවදත්ත, ලිපිනය සහ දුරකතන අංක ඇතුළත් අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහතික පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ දුරකථන අංක සමග 2024.08.01 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් පහත දැක්වෙන ලිපිනයට එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අංශ ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කරන තනතුර ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

**සභාපති, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,**
**පානලුව, පාදුක්ක.**

SPC